විශේෂ නිවේදනයයි

2024/2025 අධ්‍යයන වර්ෂයේ දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා පෙනී සිටින පීඨයේ සියලුම සිසුන් වෙත,

- ශිෂ්‍යයින්ට පසුගිය සතියේ ලබාගත් විභාග ප්‍රවේශ පත්‍රයක් තිබිය යුතුය. වැරදි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කිරීම විභාග අක්‍රමිකතාවයක් ලෙස සලකනු ලැබේ.
- අදාළ විෂය විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් වී තිබීම අනිවාර්ය වන අතර කිසිදු හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් නොවන විෂයයක් සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදෙනු නොලැබේ.
- විභාගය ආරම්භ වීමට විනාඩි 15කට පෙර ශාලාධිපති අවසර ලබා දුන් පසු විභාග ශාලාවට ඇතුල්වී නිවැරදි අංකයෙහි අසුන්ගත යුතුය.
- විභාග ශාලාවෙහි සහ පැමිණීමේ ලේඛනයෙහි අංක සඳහන් නොවන සිසුන්හට විභාගයට පෙනී සිටීමට අවසර ලබානොදේ.
- පළමු, දෙවන හා තෙවන වසර සිසුන් ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- ශිෂ්‍ය හැඳුනුම්පත නොමැති පළමු වසර සිසුන් ලියාපදිංචිය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- විභාග අක්‍රමිකතා සිදුකිරීමෙන්,
    - අදාළ විෂයෙහි ප්‍රතිඵල අවලංගු වීම සහ නැවත පෙනී සිටීමේදී 'C' සාමාර්ථයක් පමණක් ලැබීම
    - උපාධිය සම්පූර්ණ වූ වර්ෂයෙන් පසුව උපාධි ප්‍රතිඵල වර්ෂයකින් ප්‍රමාද වීම
    - උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී වීමට නොහැකි වීම මෙන්ම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් අනුමත අනිකුත් දඬුවම්ද ලැබිය හැකි බැවින් විභාග අක්‍රමිකතා වල යෙදීමෙන් වළකින ලෙස සිහිපත් කරමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය